# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.12 පැය 0720 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /714 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් විශේෂ කාර්‍ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**</u>

**01. අයිස් මත්ද්‍රව්‍ය සහ කාර් රථයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජයවර්ධනපුර විශේෂ කාර්‍ය බලකා කඳවුර.**

2025.04.11 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ සැනසුම් සේවා මාවතේදී ජයවර්ධනපුර විශේෂ කාර්‍ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 280 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත. වැඩිදුර විමර්ශනයේදී ජංගම දුරකථනයක් සහ කාර් රථයක් ද පොලිස් භාරයට ගෙන හෝමාගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන පිංකෙත මාවත, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්‍ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.11 වන දින සවස් කාලයේ වලස්මුල්ල පොලිස් වසමේ ගලහිටිය ප්‍රදේශයේදී විශේෂ කාර්‍ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 11 ග්‍රෑම් 300 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වලස්මුල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 55 ක් වන මී ඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්‍ය බලකා සෙට්ටිකුලම් කඳවුර.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කර ගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.04.11 වන දින උදෑසන කාලයේ කනගරායන්කුලම් පොලිස් වසමේ නෙදුන්කේනි ප්‍රදේශයේදී සෙට්ටිකුලම් විශේෂ කාර්‍ය බලකා කඳවුරේ නිලධාරීන්, කැබිතිගොල්ලෑව විශේෂ කාර්‍ය බලකා කඳවුරේ නිලධාරීන් සහ කනගරායන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ඒකාබද්ධව වැටලීමක් සිදුකර **ගංජා කිලෝ 01 ග්‍රෑම්**

**820 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන කනගරායන්කුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වන තරුමපුරම් නැගෙනහිර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කනගරායන්කුලම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාකරේ විශේෂ කායර් බලකා කඳවුර.

2025.04.11 වන දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ මානික්කකුලරම් කැලෑබඳ ප්‍රදේශයේදී වාකරේ විශේෂ කායර් බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් සහ වාකරේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් සමඟ ලද තොරතුරක් මත ඒකාබද්ධව වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 20 ක් සහ පෙරීමට යොදාගන්නා උපකරණ සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වාකරේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 40 ක් වන පුච්චංකේනි, කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**